මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම් කාර්යාලය
27-5-1994
මහනුවර.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை
# The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

අති විශේෂ அதிவிசேஷமானது EXTRAORDINARY

අංක 805/14—1994 පෙබරවාරි 11 වැනි සිකුරාදා—1994.02.11

805/14 ஆம் இலக்கம் — 1994 ஆம் ஆண்டு பெப்புருவரி மாதம் 11 ஆம் திகதி வெள்ளிக்கிழமை

No. 805/14 – FRIDAY, FEBRUARY 11, 1994

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.) (அரசாங்கத்தின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது) (Published by Authority)


## IV (අ) වැනි කොටස—පළාත් සභා

### පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාත් සභාව

1993 අංක 01 දරන මධ්‍යම පළාතේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය

මධ්‍යම පළාතේ පළාත් සභාවේ 1990 අංක 17 දරන මුදල් ප්‍රඥප්තියේ (1) දරන වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, මධ්‍යම පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල්, නීතිය සහ සාමය, ප්‍රාදේශීය පාලනය, සැලසුම්, ඉඩම්, පළාත් පාලන හා අධ්‍යාපන පිළිබඳ ඇමති විරසූරිය දිසානායක මුදියන්සේලාගේ පුංචි බණ්ඩා දිසානායක වන මම, මධ්‍යම පළාත් සභාවේ 1993 අංක 01 දරන මධ්‍යම පළාතේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය 1991.01.01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු යයි මෙයින් නියම කරමි.

ඩබ්ලිව්. ඩී. එම්. පී. බී. දිසානායක,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල්, නීතිය සහ සාමය,
ප්‍රාදේශීය පාලනය, සැලසුම්, ඉඩම්, පළාත් පාලන හා අධ්‍යාපන කටයුතු
පිළිබඳ අමාත්‍ය.

1994 පෙබරවාරි මස් 03 වැනි දින,
මහනුවර දී ය.

### 1993 අංක 01 දරන මධ්‍යම පළාතේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය

***1990 අංක 17 දරන මධ්‍යම පළාතේ මුදල් ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.***

මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් මෙසේ සම්මත කරනු ලැබේ.

1. මේ ප්‍රඥප්තිය 1993 අංක 01 දරන මධ්‍යම පළාතේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය ලෙස හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. 1990 අංක 17 දරන මධ්‍යම පළාතේ මුදල් ප්‍රඥප්තියේ දිඝී නාමය 1982 අංක 43 දරන "මුද්දර ගාස්තු පනතේ ඇතැම් විධිවිධානවලට අනුකූල වේ" යන වචනය ඉවත්කොට ඒ වෙනුවට 1982 අංක 43 දරන "මුද්දර ගාස්තු පනතේ සහ සංශෝධිත පරිදි වූ සුරාබදු පනතේ සහ සංශෝධිත පරිදි වූ මහ නගර සභා ආඥාපනතේ සහ සංශෝධිත පරිදි වූ නගර සභා ආඥාපනතේ සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ ඇතැම් විධිවිධානවලට අනුකූල වේ" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ. 1990 අංක 17 දරන මධ්‍යම පළාතේ මුදල් ප්‍රඥප්තියේ දිඝී නාමය සංශෝධනය කිරීම.

1A – CP 019949 – 1,110 (94/01)

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වූ විටක සිංහල භාෂා පාඨය බල පවත්වන්නේ ය.

02–347/1

---

## මධ්‍යම පළාත් සභාව

### 1993 අංක 02 දරන මධ්‍යම පළාතේ මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තිය

මධ්‍යම පළාතේ පළාත් සභාවේ 1990 අංක 17 දරන මුදල් ප්‍රඥප්තියේ (1) දරන වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, මධ්‍යම පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල්, නීතිය සහ සාමය, ප්‍රාදේශීය පාලනය, සැලසුම්, ඉඩම්, පළාත් පාලන හා අධ්‍යාපන පිළිබඳ ඇමති වීරසූරිය දිසානායක මුදියන්සේලාගේ පුංචි බණ්ඩා දිසානායක වන මම, මධ්‍යම පළාත් සභාවේ 1993 අංක 02 දරන මධ්‍යම පළාතේ මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තිය 1991.01.01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු යයි මෙයින් නියම කරමි.

ඩබ්ලිව්. ඩී. එම්. පී. බී. දිසානායක,
මධ්‍යම පළාතේ, පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල්, නීතිය සහ සාමය
ප්‍රාදේශීය පාලනය, සැලසුම්, ඉඩම්, පළාත් පාලන හා අධ්‍යාපන කටයුතු
පිළිබඳ අමාත්‍ය.

1994 පෙබරවාරි මස 03 වැනි දින,
මහනුවර දී ය.

### 1993 අංක 02 දරන මධ්‍යම පළාතේ මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තිය

***1990 අංක 17 දරන මධ්‍යම පළාතේ මුදල් ප්‍රඥප්තිය යටතේ එකතු කරන ලද මුද්දර ගාස්තු මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතනවලට හැරවීම සඳහා විධි විධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.***

මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් මෙසේ සම්මත කරනු ලැබේ.

ලුහුඩු නාමය.

1. මේ ප්‍රඥප්තිය 1993 අංක 02 දරන මධ්‍යම පළාතේ මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

මුද්දර ගාස්තු හැරවීම.

2. 1990 අංක 17 දරන මධ්‍යම පළාතේ මුදල් ප්‍රඥප්තිය සහ 1992 අංක 01 දරන මධ්‍යම පළාතේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය ප්‍රකාර, පළාත් සභාව විසින් මධ්‍යම පළාතේ යම් පළාත් පාලන ආයතනයක පරිපාලනමය සීමා ඇතුළත පිහිටි යම් නිශ්චල දේපලක් පැවරීම සම්බන්ධයෙන් වූ යම් සාධන පත්‍රයක් වෙනුවෙන් යම් මුද්දර ගාස්තුවක් අය කර, එකතු කර, මධ්‍යම පළාතේ පළාත් සභා අරමුදලට ගෙවා ඇති අවස්ථාවක, පළාත් සභාව විසින් ඒ මුද්දර ගාස්තුව අය කර එකතු කරනු ලැබුවේ යම් නිශ්චල දේපලක් පැවරීම සම්බන්ධයෙන් ද, ඒ නිශ්චල දේපළ පිහිටා ඇත්තේ යම් පළාත් පාලන ආයතනයක පරිපාලන සීමාවන් ඇතුළත ද, ඒ පළාත් පාලන ආයතනයේ ප්‍රධාන පරිපාලන නිලධරයා විසින්, ඉහත කී පරිදි ඒ මුද්දර ගාස්තුව අය කර, එකතු කරන ලද වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින සිට අවුරුදු 02ක් වූ කාල සීමාවක් ඇතුළත, මධ්‍යම පළාතේ පළාත් අමාත්‍ය මණ්ඩලයේ මුදල් පිළිබඳ විෂයය භාර අමාත්‍ය වරයා වෙත ලියවිල්ලකින් හිමිකමක් ඉදිරිපත් කරන ලද විට, පළාත් සභාව විසින් ඒ පළාත් පාලන ආයතනයට ඒ මුද්දර ගාස්තුවේ මුදල හැරවිය හැකිය.

රෙජිස්ට්‍රාර් ජනරාල් වරයාගේ සහතිකය.

3. 2 වැනි වගන්තිය යටතේ ඉදිරිපත් කර ලද කිසිම හිමිකමක්, ඒ හිමිකමෙහි සඳහන් කරන ලද මුද්දර ගාස්තු ගෙවීම පිළිබඳව, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් හෝ ඔහු විසින් ඔහු වෙනුවෙන් නම් කරන ලද වෙනත් යම් නිලධරයකු විසින් සහතික කරන ලද, උපලේඛනයක් ඒ හිමිකම සමග ඉදිරිපත් කරනු නොලැබුවහොත්, වලංගු නොවන්නේය.

අර්ථ නිරූපණය.

4. මේ ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය කලහොත් මිස
"ප්‍රධාන පරිපාලන නිලධරයා" යන්න :

(අ) මහ නගර සභාවක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඉන් එහි නාගරික කොමසාරිස්වරයා ; සහ

(ආ) නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඉන් එහි ලේකම්වරයා අදහස්වේ ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර එවැනි සභාවක් විසින් ක්‍රියාත්මක කරන සහ ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූපී වන හෝ සමාන වන බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා පිහිටුවනු ලබන වෙනත් යම් අධිකාරියක් ද ඊට ඇතුළත් වේ ;

"සාධන පත්‍රය" යන්නෙහි, 1990 අංක 17 දරන මධ්‍යම පළාතේ මුදල් ප්‍රඥප්තියේ ඇති අර්ථයම ඇත්තේය ;

"පළාත් සභාව" යන්නෙන්, ශ්‍රී ලංකා ජනරජයේ මධ්‍යම පළාතේ පළාත් සභාව අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල පාඨය බලපැවැත්විය යුතු බව.

5. මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර අනනුකූලතාවයක් ඇති වූ විටක, සිංහල භාෂා පාඨය බලපවත්වන්නේය.

02–347/2